# බහුපද ශ්‍රිත / ශේෂ ප්‍රමේය/සාධක ප්‍රමේය

## Polynomials / Remainder Theorem / Factor Theorem

Ruwan Darshana
B.Sc. (Hons)

**01.** සංස්ලේෂ බෙදීම මගින් ශේෂයන් සොයන්න. [නව නිර්දේශයට අයත් නොවේ.]

(i) $2x^3 + 5x^2 - 3x + 13 \div (x-1)$
(ii) $x^4 + 7x^3 + 2 \div (x+1)$
(iii) $5x^3 + 8x^2 + 9 \div (x-2)$
(iv) $x^3 + 2x^2 + 1 \div (x+3)$
(v) $20x^3 + 40x^2 + 50 \div (2x-1)$
(vi) $8x^3 + 24x + 7 \div (2x+1)$
(vii) $81x^3 + 27x^2 + 60x + 2 \div (3x-1)$

**02.** ශේෂ ප්‍රමේය මගින් ශේෂය සොයන්න.

(i) $x^3 + 5x^2 + 12$ ; $(x-1)$ න්
(ii) $x^4 + 9x^2 + 10x + 5$ ; $(x+1)$ න්
(iii) $x^5 + 2x^3 + 7x + 5$ ; $(x-2)$ න්
(iv) $2x^3 - 4x + 1$ ; $(x-3)$ න්
(v) $16x^2 + 20x + 1$ ; $(2x-1)$ න්
(vi) $100x^2 + 40x + 3$ ; $(4x-1)$ න්
(vii) $f(x)$ ; $(x-2)$ න්
(viii) $f(x)$ ; $(x-\alpha)$ න්
(ix) $g(x)$ ; $(x+3)$ න්
(x) $R(x)$ ; $(x+1)$ න්

**03.** (i) $2x^3 + 5x^2 + kx + 12$ ; $(x+2)$ න් බෙදූ විට ශේෂය 20 ක් නම්, k සොයන්න.

(ii) $x^3 + 5x^2 + ax + b$ ; $(x-1), (x-2)$ න් බෙදූ විට ශේෂයන් 9, 29 වේ. $a$, b සොයන්න.

(iii) $x^3 + ax^2 + bx + c$ ප්‍රකාශනය $(x-1), (x+1), (x-2)$ න් බෙදූ විට ශේෂයන් පිළිවෙලින් 0, −2, 3 වේ. $a$, b, c සොයන්න.

(iv) $(x+1)$ න් $2x^3 + kx^2 - 5x + 6$ බෙදූ විට ශේෂය 5 වන සේ k සොයන්න.

(v) $a$, b නියත ද, $b \neq 0$ ද නම්, $f(x) = x^2 + ax + b$ වේ. $f(x)$ ; $(x-b)$ වලින් බෙදූ විට ශේෂයත්, $(x-2b)$ වලින් බෙදූ විට ශේෂයත් සමාන නම්, b ට තිබිය හැකි අගයන් සොයන්න.

**04.** (i) $5x^3 + 9x^2 + kx + 12$ හි $(x-2)$ සාධකයක් නම් k සොයන්න.

(ii) $x^2 - kx - (k^2 - 1)$ හි $(x+2)$ සාධකයක් වන සේ k සොයන්න.

(iii) $x - 3$ යනු $x^2 - (2a+1)x + 2b$ හිත්, $x^2 - (b+2)x + 5a$ හිත් පොදු සාධකයක් නම් $a$ සහ b සොයන්න.

(iv) $(x-2)$ යනු $x^4 + 5x^2 + 7$ ප්‍රකාශනයේ සාධකයක් නොවන බව පෙන්වන්න.

(v) $(x - a - b)$ යනු $x^3 - 3abx - (a^3 + b^3)$ හි සාධකයක් බව පෙන්වන්න.

**05.** (i) $f(x)$ ; $(x-2)$ න් බෙදූ විට ශේෂය 20 ක් වේ. $g(x)$ ; $4f(x) + 20$ වේ. $g(x)$ ; $(x-2)$ න් බෙදූවිට ශේෂය සොයන්න.

(ii) $f(x)$, $(x-1)$, $(x+1)$, $(x-5)$ න් බෙදූ විට ශේෂයන් පිළිවෙලින් 10, −3, −8 වේ. $g(x) = xf(x) + 5$ ද, $h(x) = x^2 f(x) + 9x + 1$ ද $R(x) = 2f(x) - 10$ ද වේ. $g(x)$ ; $(x-1)$ න් බෙදූ විට ශේෂය සොයන්න.

22
22

REVISION

# COMBINED MATHS

ADVANCED LEVEL EXAMINATION

## REMAINDER THEOREM

REMAINDER THEOREM IS AN APPROACH OF EUCLIDEAN DIVISION OF POLYNOMIALS. ACCORDING TO THIS THEOREM, IF WE DIVIDE A POLYNOMIAL P(X) BY A FACTOR ( X - A), THAT ISN'T ESSENTIALLY AN ELEMENT OF THE POLYNOMIAL; YOU WILL FIND A SMALLER POLYNOMIAL ALONG WITH A REMAINDER.

රුවන් දර්ශන
B.Sc Hon's
(Univercity of Colombo)

(ii) සාධක ප්‍රමේයය ප්‍රකාශ කරන්න.
$f(x) = x^3 - x^2 + ax + b$ බහුපද ශ්‍රිතයකි. $(x+1)$ සාධකයක් වන අතර, $f(x)$ බහුපදය $(x-1)$ න් බෙදූ විට ශේෂය $-8$ වේ. $a$ හා b නියත සොයන්න. ප්‍රකාශනයේ සම්පූර්ණ සාධක සොයන්න.

$\dfrac{6x^3 + 5x^2 - 7}{3x^2 + 2x}$ භින්න භාග වලට වෙන් කරන්න.

**74.** ශේෂ ප්‍රමේයය ප්‍රකාශ කර සාධනය කරන්න.
$f(x) = 2x^4 + 3x^3 + ax^2 + bx + c$ බහුපදය $(x-2)(x+3)$ න් බෙදූ විට ලැබෙන ශේෂය $-5x + 2$ වේ. $6a = -64 - c = 6b$ බව පෙන්වන්න. එම බහුපදය $(x-1)$ න් බෙදූ විට ලැබෙන ශේෂය $a$ පමණක් ඇසුරෙන් සොයන්න.

**75.** $ax^5 - 2x^3 + x^2 + b \equiv (x^2 - 1) f(x) - x - 2$ බව දී ඇත. මෙහි $a$ හා b නියත ද, $f(x)$ බහු පදයක් ද වේ. $a$ හා b අගයන්න. $f(x)$ බහුපදය $x + 2$ න් බෙදූ විට ශේෂය සොයන්න.

**76.** $(x + y)^3$ ප්‍රසාරණය කරන්න. එනයින් $x^3 + y^3 + z^3 - 3xyz$ සාධකවලට වෙන් කරන්න.
$(a - b)^3\ (b - c)^3\ (c - a)^3$
$(a + b)^3\ (a - b)^3 + (b + c)^3\ (b - c)^3 + (c + a)^3\ (c - a)^3$
ප්‍රකාශනවල සාධක වෙන් කිරීමට ඉහත ප්‍රතිඵල භාවිතා කරන්න. $k\ (\neq 1)$ නියතයක් විට $k(x + 2)^2 - (x - 1)(x - 2)$ නම් ප්‍රකාශය $x$ හි එක් අගයක් සඳහා පමණක් ශූන්‍ය වේ නම්, k හි අගය සොයන්න. එය අවම අගයක් ගන්නේ නම්, k හි තිබිය යුතු පරාසය සොයන්න.

**77.** (i) $P(x)$ බහුපදය $(x - 1)$ න් බෙදූ විට ශේෂය 2 වන අතර, $(x - 2)$ බෙදූ විට ශේෂය 3 වේ. $P(x)$ $(x - 1)(x - 2)$ න් බෙදූ විට ශේෂය $ax + b$ වේ. $a$, b සොයන්න. තවද $P(x)$ බහුපදය 3 මාත්‍රයේ වන අතර, $x^3$ හි සංගුණකය 1 බව දී ඇත. $-1$ යනු $P(x) = 0$ සමීකරණයේ මූලයක් ද නම්, $P(x)$ බහුපදය සොයා, $P(x) = 0$ සමීකරණයට වෙනත් තාත්ත්වික මූල නැති බව පෙන්වන්න.
(ii) $(x + y + z)^3 - (y + z - x)^3 - (z + x - y)^3 - (x + y - z)^3$ සාධක සොයන්න.

**78.** $x^3 + px^2 + q$ හා $ax^3 + bx + c$ යන දෙකට $x + 1$ පොදු සාධකයක් නම් එය $apx^2 - bx + aq - c$ හි ද සාධකයක් වන බව පෙන්වන්න. $x^3 + \sqrt{7}x^2 - 14\sqrt{7}$ හා $2x^3 - 13x - \sqrt{7}$ යන බහුපද දෙකට පොදු සාධකයක් ඇති බව පෙන්වන්න. $2x^3 - 13x - \sqrt{7} = 0$ සමීකරණය විසඳන්න.

**79.** $f(x) = 3x^3 - 4x^2 - 5x + 2$ ප්‍රකාශනය ඒකජ සාධක 3 ක ගුණිතයක් ලෙස ප්‍රකාශ කරන්න. එනයින් $3e^{3x} - 4e^{2x} - 5e^x + 2 = 0, \quad x \in R$ සමීකරණයේ විසඳුම් සොයන්න.

**80.** $f(x)$ ශ්‍රිතයට පුනරාවර්තන සාධකයක් ඇත්නම්, එම සාධකය $f^1(x)$ වල සාධකයක් බව පෙන්වන්න.
$x^3 - 5x^2 + 7$, $(x - 1)^2$ න් බදූ විට ශේෂය සොයන්න.

81. $[x-(P+Q)]$ යනු $x^3-3PQx-(P^3+Q^3)$ හි සාධකයක් බව පෙන්වන්න. එනයින් $x^3-6x-6=0$ හි තාත්ත්වික මූලයන් සොයන්න.

82. $x^2+2$ යනු $x^4-6x^2+p$ හි සාධකයකි. p නියතය සොයන්න. එනයින් $x^4-6x^2+p$ හි සාධක සොයන්න.

83. m, n නිඛිලව සිටියද්දී $x^m+nx$, $x^2-x-2$ වලින් බෙදෙන විට ලැබෙන ශේෂය $2x+6$ නම් m, n සොයන්න.

## පසුගිය විභාග ගැටළු



84. c හා d තාත්ත්වික සංඛ්‍යා වේ. ($c\neq 0$)
$f(x)=x^3+4x^2+cx+d$ වේ. $(x+2)$ මගින්, $f(x)$ බෙදූවිට ශේෂය $-c^3$ වේ. තවද $(x-2)$ යනු $f(x)$ හි සාධකයක් වේ. $c=-2$ සහ $d=-12$ බව පෙන්වන්න.

**[2018 A/L]**

85. $g(x)=x^3+px^2+qx+1$ යැයි ගනිමු. මෙහි $p, q\in\mathbb{R}$ වේ. $(x-1)(x+2)$ මගින් $g(x)$ බෙදූ විට ශේෂය $3x+2$ වේ. $(x-1)$ මගින් $g(x)$ බෙදූ විට ශේෂය 5 බව හා $(x+2)$ මගින් $g(x)$ බෙදූ විට ශේෂය $-4$ බව පෙන්වන්න. p හා q හි අගයන් සොයා $(x+1)$ යන්න $g(x)$ හි සාධකයක් බව පෙන්වන්න. **[2017 A/L]**

86. $p(x)=x^3+2x^2+3x-1$ හා $q(x)=x^2+3x+6$ යැයි ගනිමු. ශේෂ ප්‍රමේයය භාවිතයෙන්, $p(x)$ යන්න $(x-1)$ මගින් බෙදූ විට ශේෂයත්, $q(x)$ යන්න $(x-2)$ මගින් බෙදූ විට ශේෂයත් සොයන්න. $p(x)=(x-1)\,q(x)+5$ බව සත්‍යාපනය කර, $p(x)$ යන්න $(x-1)(x-2)$ මගින් බෙදූ විට ශේෂය සොයන්න. **[2016 A/L]**

87. (i) $f(x)\equiv 2x^4+\gamma x^3+\delta x+1$ යැයි ගනිමු. මෙහි $\gamma$ හා $\delta$ තාත්ත්වික නියත වේ.
$f(-\frac{1}{2})=0$ හා $f(-2)=21$ බව දී ඇති විට, $f(x)$ හි තාත්ත්වික ඒකජ සාධක දෙක සොයන්න.

(ii) සියලුම තාත්ත්වික $x$ සඳහා $(x^2+x+1)\,p(x)+(x^2-1)\,Q(x)=3x$ සමීකරණය සපුරාලන $P(x)$ හා $Q(x)$ ඒකජ ප්‍රකාශන දෙක සොයන්න. **[2015 A/L]**

**88.** $a \in \mathrm{R}$ යැයි ද $f(x) = 3x^3 + 5x^2 + ax - 1$ යැයි ද ගනිමු. $(3x-1)$ යන්න $f(x)$ හි සාධකයක් බව දී ඇත. $a$ හි අගය සොයන්න. $f(x)$ යන්න $(3x-1)(x+\mathrm{k})^2$ ආකාරයට ප්‍රකාශ කරන්න. මෙහි k යනු නියතයකි. ඉහත ප්‍රකාශනයෙහි $3x-1$ යන්න b හා c නියත වන $\mathrm{b}(x+1)+\mathrm{c}$ ආකාරයෙන් ලිවීමෙන් $f(x)$ යන්න $(x+1)^3$ න් බෙදූ විට ශේෂය සොයන්න. **[2014 A/L]**

**89.** $f(x) = ax^3 + \mathrm{b}x^2 - 11x + 6$ යැයි ගනිමු. මෙහි $a, \mathrm{b} \in \mathrm{R}$ වේ. $(x-1)$ යන්න $f(x)$ හි සාධකයක් වේ නම් හා $f(x)$ යන්න $(x-4)$ න් බෙදූ විට ලැබෙන ශේෂය $-6$ නම් $a$ හා b වල අගයන් සොයන්න. $f(x)$ හි අනෙක් ඒකජ සාධක දෙකත් සොයන්න. **[2013 A/L]**

**90.** $g(x) \equiv x^4 + 4x^3 + 7x^2 + 6x + 2$ යැයි ගනිමු. ශේෂ ප්‍රමේයය නැවත නැවත යොදා ගනිමින් $(x+1)^2$ යන්න $g(x)$ හි සාධකයක් බව පෙන්වන්න. $g(x)$ යන්න $(x-a)^2\ (x^2 + \mathrm{b}x + \mathrm{c})$ ආකාරයෙන් ප්‍රකාශ කරන්න. මෙහි $a$, b හා c යනු නිර්ණය කළ යුතු නියත වෙයි. $x$ හි සියලු තාත්ත්වික අගයන් සඳහා $g(x) \geq 0$ බව අපෝහනය කරන්න. **[2012 A/L]**

**91.** $f(x) = x^3 - 3a\mathrm{b}x - ax - (a^3 + \mathrm{b}^3)$ යැයි ගනිමු. $a$ හා b තාත්ත්වික සංඛ්‍යා වේ. $(x - a - \mathrm{b})$ යනු $f(x)$ හි සාධකයක් බව පෙන්වන්න. $f(x)$ හි අනෙක් සාධකය වර්ගජ ආකාරයෙන් සොයන්න. එනයින් හෝ අන් ක්‍රමයකින් හෝ $a$ හා b ප්‍රභින්න නම් $f(x) = 0$ ට තාත්ත්වික මූල එකක් පමණක් තිබෙන බව පෙන්වන්න. $x^3 - 9x - 12 = 0$ ට තාත්ත්වික මූල එකක් පමණක් තිබෙන බව අපෝහනය කර එය සොයන්න. **[2011 A/L]**

**92.** $f(x)$ බහුපදය $x - \alpha$ වලින් බෙදූ විට ලැබෙන ශේෂය $f(\alpha)$ බව පෙන්වන්න. $f(x)$ බහුපදය $(x-\alpha)(x-\beta)(x-\gamma)$ වලින් බෙදූ විට ලැබෙන ශේෂය $\mathrm{A}(x-\beta)(x-\gamma) + \mathrm{B}(x-\alpha)(x-\gamma) + \mathrm{C}(x-\alpha)(x-\beta)$ ආකාරය ගනී. මෙහි $\alpha, \beta$ සහ $\gamma$ සමාන නොවන තාත්ත්වික සංඛ්‍යා වේ. $\alpha, \beta, \gamma, f(\alpha), f(\beta)$ සහ $f(\gamma)$ ඇසුරෙන් A, B, C නියත ප්‍රකාශ කරන්න. එනයින්, $x^5 - \mathrm{k}x$ යන්න $(x+1)(x-1)(x-2)$ න් බෙදූ විට ශේෂයේ $x$ හි පදය අඩංගු නොවන ලෙස k නියතයේ අගය සොයන්න. **[2009 A/L]**

**93.** $f(x)$ බහුපදය $(x-\alpha)$ වලින් බෙදූ විට ලැබෙන ශේෂය $f(\alpha)$ බව පෙන්වන්න. $f(x)$ බහුපදය $(x-\alpha)(x-\beta)$ වලින් බෙදූ විට ලැබෙන ශේෂය $\mathrm{A}x + \mathrm{B}$ ආකාරය ගනී. මෙහි $\alpha \neq \beta$ වේ. $\alpha, \beta, f(\alpha)$ සහ $f(\beta)$ ඇසුරෙන් A හා B නියත ප්‍රකාශ කරන්න. එනයින්, $x^3 + \mathrm{k}x^2 + \mathrm{k}$ යන්න $(x-1)(x+2)$ න් බෙදූ විට ශේෂයේ නියත පදය අඩංගු නොවන ලෙස k නියතයේ අගය සොයන්න. **[2008 A/L]**

**94.** $f(x)$ යනු මාත්‍රය 3 ට වැඩි $x$ හි බහු පදයකි. පිළිවෙලින් $(x-1)$, $(x-2)$ හා $(x-3)$ යන්නෙන් $f(x)$ බෙදූ විට ලැබෙන ශේෂය $a$, b හා c වේ. ශේෂ ප්‍රමේයය නැවත නැවත යෙදීමෙන් $(x-1)(x-2)(x-3)$ යන්නෙන් $f(x)$ බෙදූ විට ලැබෙන ශේෂය, $\lambda(x-1)(x-2) + \mu(x-1) + 2$ ලෙස ප්‍රකාශ කළ හැකි බව පෙන්වන්න. මෙහි $\lambda, \mu$ හා $x$ යනු නියත වේ. $a$, b හා c ඇසුරෙන් $\lambda, \mu$ හා $x$ සොයන්න. **[2007 A/L]**

**95.** $a^3(b-c)+b^3(c-a)+c^3(a-b)$ සාධක සොයන්න.

*[2006 A/L]*

**96.** $P(x) = ax^3 + bx + c$ යන්න $(x+1)$ න්, $(x-1)$ න් හා $(x-2)$ න් බෙදූ විට ලැබෙන ශේෂ පිළිවෙලින් 4, 0 හා 4 වේ. $a$, b, c හි අගයන් සොයා $P(x)$ හි ඒකජ සාධක සියල්ල නිර්ණය කරන්න.

*[2005 A/L]*

**97.** $P(x)$ වර්ගජ බහුපදයක් පිළිවෙලින් $(x-1)$, $(x-2)$ හා $(x-3)$ යන්නෙන් බෙදූ විට ශේෂයන් $1, \frac{1}{2}$ හා $\frac{1}{3}$ වේ. $(x-1)$, $(x-2)$ හා $(x-3)$ යනු $Q(x) = xp(x) - 1$ මගින් දෙනු ලබන $Q(x)$ බහුපදයේ සාධක බව පෙන්වන්න. ඒ නයින් $Q(x)$ සොයන්න.

*[2004 A/L]*

**98.** $f(x, y) = 2x^2 + \lambda xy + 3y^2 - 5y - 2$ ප්‍රකාශනය රේඛීය සාධක දෙකක ගුණිතයක් ලෙස පවතින $\lambda$ හි අගයන් සොයන්න.

*[2000A/L]*

**99.** $x(y^4 - z^4) + y(z^4 - x^4) + z(x^4 - y^4)$ හි සාධක සොයන්න. *[1999 A/L]*

**100.** $x^3 + y^3 + z^3 - 3xyz$ හි සාධක සොයන්න. ප්‍රභින්න p, q, r සඳහා $x^3 + y^3 + z^3 = 3(p-q)(q-r)(r-p)$ සහ $px + qy + rz = 0$ ද $x + y + z = 0$ නම්, $x = q - r$, $y = r - p$ සහ $x = p - q$ බව පෙන්වන්න.

*[1998 A/L]*

**101.**(a) $f(a, b, c) \equiv (a+b+c)^3 - a^3 - b^3 - c^3$ හි සාධක සොයන්න. $f(a, b, c)$ යන්න $(a+b+c)^{1997} - a^{1997} - b^{1997} - c^{1997}$ හි සාධකයක් බව අපෝහනය කරන්න.

(b) $f(x)$ බහුපද ශ්‍රිතයක් වේ. $f(x) \equiv x^5 + 3x^4 - 2x^3 + 2x^2 - 3x + 1$

(i) $x - 1$ හෝ $x + 1$ $f(x)$ හි සාධකයක් නොවන බව පෙන්වන්න.

(ii) $f(x)$, $x^2 - 1$ බෙදූ විට ශේෂය සොයන්න.

(iii) $f(x)$, $x^2 + 1$ න් බෙදූ විට ශේෂය 2 බව පෙන්වා, එමගින් $f(x) = 2$ හි එක් තාත්වික මූලයක් සොයන්න.

*[1997 A/L]*

**102.**(i) $(b+c)^3(b-c) + (c+a)^3(c-a) + (a+b)^3(a-b)$ සාධක සොයන්න.

(ii) p, q, r $(p \neq 0)$ යනු තාත්වික නියත විට $px^4 + qx^3 + rx^2 - qx + p = 0$ සමීකරණය y හි වර්ගජ සමීකරණයට ඌනනය කළ හැකි බව පෙන්වන්න. මෙහි $y = x -$ වේ. එනයින් ඉහත දක්වා ඇති සමීකරණයට තාත්වික මූල තිබීම සඳහා p, q, r මගින් සපුරාලිය යුතු අවශ්‍යතාවයක් සොයන්න.

$(x-2)^3$ *[1996 A/L]*

**103.**(i) $t = x + \frac{1}{x}$ යැයි ලියමින් $x^4 - 5x^3 + 8x^2 - 5x + 1 = 0$ යන සමීකරණයේ මූල සියල්ලම සොයන්න.

(ii) $E = x^4 - 4x^3 + 9x^2 - 10x + 7 = 0$ යයි ගනිමු. $y^2 + y + a$ ආකාරයෙන් E ලිවිය හැකි බව පෙන්වන්න. මෙහි $a$ නියතයක් ද, y යන්න b හා c නියත වන $x^4 + bx + c$ ආකාරයෙන් ද වේ. එනයින් සියලු තාත්ත්වික $x$ සඳහා $E > 3$ බව පෙන්වන්න.

(iii) $\frac{1}{(x-2)(x-1)^3} = \frac{k}{x-2} + \frac{f(x)}{(x-1)^3}$ වන සේ k නියතයක් සහ $x$ හි ශ්‍රිතයක් වන f සොයන්න. $x - 1$ හි බහුපදයක් ලෙස $f(x)$ ප්‍රකාශ කරන්න. එනයින්

හි භින්න භාග සොයන්න.

[1992 A/L]

**104.** ඒකජ සාධක දෙකක් ලබා ගැනීමෙන් $(a - x)^4 + (x - 1)^4 - (a - 1)^4$ ප්‍රකාශනයේ සාධක සොයන්න.

[1993 A/L]

**105.** (i) $f(x, y, z) \equiv x^4(y - z) + y^4(z - x) - z^4(x - y)$ හි සාධකයක් $(x - y)$ බව පෙන්වන්න. එනයින් ප්‍රකාශනය පූර්ණ ලෙස සාධකවලට ඛණ්ඩනය කරන්න. $x$, y, z වූ කලී ඒවායෙන් කිසිම දෙකක් එකිනෙකට සමාන නොවන පරිදි වූ තාත්ත්වික සංඛ්‍යා නම් $f(x, y, z)$ ශූන්‍ය විය නොහැකි බව අපෝහනය කරන්න.

(ii) $ax^3 + bx + c$ ප්‍රකාශනයට $x^2 + k + 1$ ආකාරයේ සාධකයක් ඇත්නම් $a^2 - c^2 = ab$ බව පෙන්වන්න. මෙම අවස්ථාවෙහි දී $ax + bx + c$ සහ $cx^3 + bx^2 + a$ ප්‍රකාශනවලට පොදු වර්ගජ සාධකයක් තිබෙන බව අපෝහනය කරන්න.

[1991 A/L]

**106.** (i) $f(x) = x^4 - bx^3 - 11x^2 + 4(b + 1)x + a$, මෙහි $a$ සහ b නියත වේ.

I. $f(x)$ වර්ග ප්‍රකාශනයක පරිපූර්ණ වර්ගයක් බව ද

II. $x + 2$ යනු $f(x)$ හි සාධකයක් බව ද දී ඇත. $a$ සහ b සොයා $f(x)$ හි සාධක සියල්ල සොයන්න.

(ii) $(x + y + z)^3 - x^3 - y^3 - z^3$ හි සාධක සොයන්න. ඒ නයින් හෝ අන් ක්‍රමයකින් හෝ $(a + b + c)^3 - (b + c - a)^3 (c + a - b)^3 - (a + b - c)^3 = 24abc$ බව සාධනය කරන්න.

[1990 A/L]

**107.** (i) $f(x) \equiv 2x^4 + (3k - 4)x^3 + (2k^2 - 5k - 5)x^2 + (2k^3 - 2k^2 - 3k - 6)x + 6$ හි $x^2 - k$ සාධකයක් වන පරිදි k හි අගයන් සොයන්න. k හි එක් එක් අගයට අනුරූප $f(x)$ හි ඉතිරි සාධක සොයන්න.

(ii) $x^2 + y^2 + z^2 - yz - zx - xy = \frac{1}{2}[(y - z)^2 + (z - x)^2 + (x - y)^2]$ බව පෙන්වන්න. $x = b + c - a, y = c + a - b, z = a + b$ නම් $x^3 + y^3 + z^3 - 3xyz = 4(a^3 + b^3 + c^3 - 3abc)$ බව අපෝහනය කරන්න.

[1989 A/L]

**108.** $f(x, y, z) \equiv x(y^4 - z^4) + y(z^4 - x^4) + z(x^4 - y^4)$ යයි ගනිමු. $(x - y)(y - z)$ සහ $(z - x)$ යනු $f(x, y, z)$ සාධක බව පෙන්වන්න. එනයින් $f(x, y, z)$ සාධකවලට වෙන් කරන්න.

[1986 A/L]

**109.** (i) $f(x, y, z) \equiv (x + y + z)^5 - x^5 - y^5 - z^5$ යයි ගනිමු. $(x + y), (y + z), (z + x)$ යනු $f(x, y, z)$ හි සාධක බව පෙන්වන්න. එනයින් $f(x, y, z)$ සාධක වලට වෙන් කරන්න.

(ii) $(x^2 - px + 1)$ යනු $ax^5 + bx^2 + c$ හි සාධකයක් නම්, එවිට, $(a^2 - c^2)(a^2 - c^2 + bc) = a^2b^2$ බව සාධනය කරන්න. මෙම අවශ්‍යතාව සපුරාලයි නම් එවිට, $(x^2 + px + 1)$ යන්න $cx^5 + bx^3 + a$ හි සාධකයක් ද බව පෙන්වන්න.

[1985 A/L]

**110.** (i) $(b - c)^3 + (c - a)^3 + (a - b)^3 \equiv 3(a - b)(b - c)(c - a)$ බව පෙන්වන්න.

(ii) $f(x) \equiv px^4 + qx^3 + rx^2 + sx + t$ වේ. $x^2 + a$ මගින් $f(x)$ බෙදූ විට ලැබෙන ශේෂය $(s - qa)x + pa^2 - ra + t$ බව පෙන්වන්න. $\alpha$ සහ $-\alpha$ යනු $f(x) = 0$ හි මූල නම් $ps^2 - qrs + q^2t = 0$ සම්බන්ධය $p, q, r, s, t$ මගින් සපුරාලන බව සාධනය කරන්න.

[1984 A/L]

**111.** $x^2 + 1$ න් හරියටම බෙදෙන එහෙත් $(x - 1)^2(x - 2)$ න් බෙදූ විට $6x + 8$ ක ශේෂයක් ඉතිරිවන $x$ හි සිව්වන මාත්‍රයේ බහුපදය සොයන්න.

[1983 A/L]

**112.** (i) $(x + y)^2(x + z)^2(y - z) + (y + z)^2(y + x)^2(z - x) + (z + x)^2(z + y)^2(x - y)$ යන්න තාත්ත්වික ඒකජ සාධක තුනකට සහ වර්ගජ සාධක එකකට සාධක කරන්න.

(ii) $x^8 + 2x^7 + ax^2 + bx + c$ ප්‍රකාශනය $x^2 + x - 2$ යන්නෙන් හරියටම බෙදිය හැක. ප්‍රකාශනය $x + 1$ යන්නෙන් බෙදූ විට $-8$ ක ශේෂයක් ඉතිරි වේ. $a, b, c$ සොයන්න.

[1966 A/L]

**113.** (i) $2x^4 + x^3 - x^2 + ax + b$ යන්න $x^2 - 1$ න් බෙදූ විට ශේෂය $2x + 3$ වේ. $a$ හා $b$ වල අගයන් සොයන්න.

(ii) $(x, y, z) \equiv (y - z)^5 + (z - x)^5 + (x - y)^5$ සරල සාධක තුනක් සහ වර්ගජ සාධක එකක් ද වන සේ සාධක සොයන්න.

[1964 A/L]

h $(x)$ ; $(x+1)$ න් බෙදූ විට ශේෂය සොයන්න.
R $(x)$ ; $(x-5)$ න් බෙදූ විට ශේෂය සොයන්න.

(iii) $(x-1)$ යනු $f(x)$ වල $g(x)$ වල සාධකයක් වේ. h $(x)$ ; $(x-2)$ න් බෙදූ විට ශේෂය 5 ක් වේ. $R(x) = 2f(x) + 3g(x) + 4h(x)$ වේ. R $(x)$ ; $(x-2)$ න් බෙදූ විට ශේෂය සොයන්න.

(iv) $f(x)$ ; $(x-2)$ න් බෙදූ විට ශේෂය 30 කි. $g(x) = xf(x) + 5$ වේ. $g(x)$ ; $(x-2)$ න් බෙදූ විට ශේෂය සොයන්න.

**06.** $P(x) = ax^3 + bx + c$ වේ. P $(x)$, $(x+1)$, $(x+2)$, $(x+3)$ න් බෙදූ විට ශේෂයන් පිළිවෙලින් 12, 12, 0 වේ.

(i) $a$, b, c සොයන්න.
(ii) P $(x)$ රේඛීය සාධකවලට වෙන් කරන්න.
(iii) P $(x) = 0$ විසඳන්න.
(iv) P $(x)$ ධන වන $x$ වල අගය පරාසය සොයන්න.

**07.** $f(x) = xp(x) + 1$ වේ. P $(x)$ බහු පදය $(x-1)$, $(x-2)$ න් බෙදූ විට ශේෂයන් $-1$, $\frac{-1}{2}$ වේ. $(x-1)$, $(x-2)$ යනු $f(x)$ වල සාධක බව පෙන්වන්න.

**08.** (i) $(x-2)$ යනු $x^3 - 5x^2 + 4x + 4$ හි සාධකයක් බව පෙන්වන්න.
(ii) $(x+1)$ යනු $5x^7 + 6x^4 + 8x + 7$ හි සාධකයක් බව පෙන්වන්න.
(iii) $(x-1)$ යනු $x^2 + 4x - 5$ හි සාධකයක් බව පෙන්වන්න.
(iv) $(x-a)$ යනු $2x^3 - 5ax^2 + 7a^2x - 4a^3$ හි සාධකයක් බව පෙන්වන්න.
(v) $f(x) = 3x^3 + 9ax^2 + 20a^2x + 14a^3$ වේ. $(x+a)$ යනු $f(x)$ හි සාධකයක් බව පෙන්වන්න.

**09.** (i) $x^4 + 5x^3 + 1$ හි $(x-1)$ සාධකයක් නොවන බව පෙන්වන්න.
(ii) $7x^3 + 6x^2 + 2$ හි $(x+2)$ සාධකයක් නොවන බව පෙන්වන්න.
(iii) $f(x) = x^2 + 2x + 30$ වේ. $a$ නියතයක් වන විට, $(x-a)$ යනු $f(x)$ හි සාධකයක් නොවන බව පෙන්වන්න.

**10.** (i) $x^3 + 5x^2 + 7x + 3$ හි $(x+1)$ සාධකයක් බව පෙන්වා, ඉතිරි සාධක සොයන්න.
(ii) $(x-1)$ යනු $x^3 + 4x^2 - x - 4$ හි සාධකයක් බව පෙන්වා, එනයින් ප්‍රකාශනය ඒකජ සාධකවලට වෙන් කරන්න.
(iii) $f(x) = 4x^3 - 3x + 1$ වේ. $(x+1)$ සාධකයක් බව පෙන්වා, ඉතිරි සාධක සොයන්න. $f(x) = 0$ විසඳන්න.
(iv) $g(x) = 2x^3 - x^2 - 18x + 9$ වේ. $(2x-1)$ යනු $g(x)$ වල සාධකයක් බව පෙන්වා, ඉතිරි සාධක සොයන්න. $g(x) = 0$ විසඳන්න.

**11.** (i) $(x-a-b)$ යනු $x^3 - 3abx - (a^3 + b^3)$ හි සාධකයක් බව පෙන්වා, ඉතිරි සාධක සොයන්න. $x^3 - 6x - 9 = 0$ විසඳන්න.

(ii) $(x-a-b-c)$ යනු $(x-a)(x-b)(x-c)-(a+b)(b+c)(c+a)$ හි සාධකයක් බව පෙන්වන්න. $(x-1)(x-2)(x+4)-18=0$ විසඳන්න.

**12.** (a) සාධක ප්‍රමේයය ලියන්න.

(b) සාධක ප්‍රමේයයේ විලෝමය ලියන්න.

(c) පහත ඒවා සාධක වෙන් කරන්න.

(i) $x^3+5x^2+2x-8$ (ii) $x^3+4x^2+7x+4$

(iii) $2x^3+7x^2-5$ (iv) $x^4+7x^3+5x^2+1$

(v) $x^3-2x-4$ (vi) $x^3-7x-6$

(vii) $x^3-(5+a)x^2+(6+5a)x-6a$ (viii) $x^4-9ax^3+5a^2x^2-6a^3x+21a^4$

**13.** ශේෂ ප්‍රමේයයේ බෙදුම් ඇල්ගොරිතමය මඟින් ශේෂය සොයන්න.

(i) $x^4+5x^3+7x+2\,;\,(x^2-4)$ න් (ii) $x^5-6x^3+2\,;\,(x^2-x)$ න්

(iii) $x^3+8x^2+6x-1\,;\,(x^2+2x)$ න් (iv) $x^2+5x+2\,;\,(x^2-a^2)$ න්

(v) $x^5+7x^2+2x-1\,;\,x^2-x-2$ න්

**14.** (i) $x^4+3x^2+Px+Q\,;\,(x^2-1)$ න් බෙදූ විට ශේෂය $6x-5$ නම්, P, Q සොයන්න.

(ii) $x^4+6x^3+\lambda x^2+\mu x+\gamma$ ප්‍රකාශනයේ $x^3-x$ සාධකයක් නම්, $\lambda, \mu, \gamma$ සොයන්න.

**15.** ශේෂ ප්‍රමේයය සම්බන්ධ ප්‍රකාශනය මඟින් බෙදා ශේෂය සොයන්න. (බෙදුම් ඇල්ගොරිතමය භාවිතා කරන්න.)

(i) $f(x)$ බහු පදය $(x^2-a^2)$ මඟින් බෙදූ විට ශේෂය,

$\frac{1}{2a}[f(a)-f(-a)]x+\frac{1}{2}[f(a)+f(-a)]$ බව පෙන්වන්න.

(ii) $g(x)$ යනු 2 වෙනි හෝ ඊට වැඩි මාත්‍රයක බහුපද ශ්‍රිතයක් නම්, $g(x)\,;\,(x-a)(x-b)$ ගෙන්

බෙදූ විට ශේෂය $\left[\dfrac{g(a)-g(b)}{a-b}\right]x+\left[\dfrac{ag(b)-bg(a)}{a-b}\right]$ බව පෙන්වන්න.

**16.** (i) $P(x)$ නම් බහු පදය $(x-a)(x-b)$ ගෙන් බෙදූ විට ශේෂය $A(x-a)+B(x-b)$ ආකාර වේ. A, B සොයන්න.

(ii) $f(x)$ නම් බහුපදය $(x+1)(x+2)(x+3)$ න් බෙදූ විට ශේෂය,
$a(x+2)(x+3)+b(x+3)(x+1)+c(x+1)(x+2)$ වේ. $f(-1)$, $f(-2)$, $f(-3)$ ඇසුරෙන් $a$, b, c සොයන්න.

**17.** (i) $x^5+kx^2+k$ ප්‍රකාශනය $(x-1)(x-2)(x-3)$ න් බෙදූ විට ශේෂයේ $x^2$ පද නොමැති නම් k සොයන්න.

(ii) $x^3 + kx^2 + 7k$ ප්‍රකාශනය $(x+1)(x+2)$ න් බෙදූ විට ශේෂයේ නියත පදය නොමැති නම් k සොයන්න.

**18.** (i) $P(x)$ නම් බහු පදය $(x-a)(x-b)$ ගෙන් බෙදූ විට ශේෂය $a$, b, $P(a)$, $P(b)$ ඇසුරෙන් සොයන්න. එනයින් $x^5 - \lambda x^2 + 1$; $(x-1)(x-2)$ න් බෙදූ විට ශේෂයේ නියත පදය නොමැති නම්, $\lambda$ සොයන්න.

(ii) $f(x)$ නම් බහුපද ශ්‍රිතය $(x-1)(x-2)(x-3)$ මගින් බෙදූ විට ශේෂය, $a(x-2)(x-3) + b(x-3)(x-1) + c(x-1)(x-2)$ වේ. $a$, b, c හි අගයන් $f(1)$, $f(2)$, $f(3)$ මගින් සොයන්න.
තවද, $x^5 + kx^2$, $(x-1)(x-2)(x-3)$ න් බෙදූ විට ශේෂයේ $x^2$ පද නොමැති නම්, k හි අගය අපෝහනය කරන්න.

**19.** (i) $x^4 + 2x^3 + 9x^2 + 7x + 8$ ; $(x^2 + 2)$ න් බෙදූ විට ශේෂය සොයන්න.
(ii) $x^6 - 4x^5 + x^2 + x$ ; $(x^2 + 1)$ න් බෙදූ විට ශේෂය සොයන්න.
(iii) $x^4 - 5x^3 + 7x^2 + 1$ ; $(x^2 - 5)$ න් බෙදූ විට ශේෂය සොයන්න.
(iv) $16x^3 + 8x^2 - 12x + 9$ ; $(2x^2 + 1)$ න් බෙදූ විට ශේෂය සොයන්න.
(v) $27x^3 + 81x^2 + 4x + 1$ ; $(3x^2 - 1)$ න් බෙදූ විට ශේෂය සොයන්න.
(vi) $Px^3 + Qx^2 + Rx + S$ ; $(x^2 + K^2)$ න් බෙදූ විට ශේෂය සොයන්න.
(vii) $2x^3 + bx^2 + cx + 7$ ; $(x^2 + k^2)$ න් බෙදූ විට ශේෂය සොයන්න.

**20.** (i) $7x^4 + 5x^3 + ax^2 + bx + 6$ ; $(x^2 + 1)$ න් බෙදූ විට ශේෂය $5x - 2$ නම්, $a$, b සොයන්න.
(ii) $5x^4 - 2x^3 + Px^2 + Qx + 9$ ප්‍රකාශනයේ $(x^2 - 2)$ සාධකයක් නම්, P, Q සොයන්න.
(iii) $\lambda x^3 + 3x^2 - 5x + \mu$ ප්‍රකාශනයේ $x^2 + k^2$ සාධකයක් නම්, $\lambda\mu = -15$ බව පෙන්වන්න.

**21.** (i) $x^5 + 7x^4 - 6x^3 - 2x + 1$ ප්‍රකාශනය $(x^3 + 2)$ න් බෙදූ විට ශේෂය සොයන්න.
(ii) $7x^6 + 4x^5 - 5x^2 + x + 9$ ප්‍රකාශනය $(x^3 - 1)$ න් බෙදූ විට ශේෂය සොයන්න.
(iii) $(x^3 + 1)$ යනු $x^6 + ax^5 + bx^4 + cx^3 - 7$ හි සාධකයක් නම්, $a$, b, c සොයන්න.

**22.** (i) $5x^3 + 7x^2 - 4x + 1$; $x^2 - 2x + 1$ න් බෙදූ විට ශේෂය සොයන්න.
(ii) $x^4 + 5x^3 - 4x^2 + 8$ ; $x^2 - x + 1$ න් බෙදූ විට ශේෂය සොයන්න.
(iii) $2x^4 + 3x^3 + 5x^2 - ax + b$ ප්‍රකාශනය $x^2 + x + 1$ න් බෙදේ නම් $a$, b සොයන්න.

**23.** (i) ශේෂ ප්‍රමේය නැවත නැවත යෙදීමෙන්, $(x-1)^2$ යනු $x^2 + x^2 - 5x + 3$ සාධකයක් බව පෙන්වන්න.
(ii) ශේෂ ප්‍රමේය නැවත, නැවත යෙදීමෙන් $(x+1)^2$ යනු $3x^3 + 7x^2 + 5x + 1$ හි සාධකයක් බව පෙන්වන්න.

Ruwan Darshana

24. (i) $x^3 + 3x^2 + 7x + 5$; $(x-1)$ හි ශ්‍රිතයක් ලෙස ලියන්න.
(ii) $x^3 + 8x^2 + 10$; $(x+1)$ හි ශ්‍රිතයක් ලෙස ලියන්න.
(iii) $x^4 + 3x + 5$; $(x-2)$ හි ශ්‍රිතයක් ලෙස ලියන්න.

25. පහත සමීකරණ විසඳන්න.
(i) $x^4 + x^3 - 4x^2 + x + 1 = 0$
(ii) $x^4 - 5x^3 + 8x^2 - 5x + 11 = 0$
(iii) $x^4 - 5x^3 + 8x^2 - 5x + 1 = 0$
(iv) $5x^4 - 11x^3 + 16x^2 - 11x + 5 = 0$

26. පහත සමීකරණ විසඳන්න.
(i) $x^3 + 3x^2 - x - 3 = 0$
(ii) $x^3 + 7x^2 + 6x = 0$
(iii) $x^3 - 6x^2 + 11x - 6 = 0$
(iv) $4x^3 - 3x + 1 = 0$
(v) $x^3 + 5x^2 + 9x + 5 = 0$

27. (i) $9x^4 - 6x^3 + 13x^2 + lx + m$ පරිපූර්ණ වර්ගයක් නම්, $l$ හා m සොයන්න.
(ii) $9x^6 - 24x^5 + 34x^4 - 12x^3 - 7x^2 + 12x + 4$ ප්‍රකාශනයේ වර්ගමූලය සොයන්න.
(iii) $16x^8 - 16x^6 + 8x^5 - 36x^4 - 4x^3 + 21x^2 - 10x + 25$ වර්ගමූලය සොයන්න.

28. විසඳන්න.
(i) $3^{2x+1} + 3^2 = 3^{x+3} + 3^x$
(ii) $(3 - 2\sqrt{2})^{x^2-2} + (3 + 2\sqrt{2})^{x^2-2} - 6 = 0$
(iii) $4^x - 5 \times 2^x + 4 = 0$
(iv) $4^x + 6^x = 9^x$

29. විසඳන්න.
(i) $\sqrt{5x^2 - 6x + 8} - \sqrt{5x^2 - 6x - 7} = 1$
(ii) $(x^2 - 5x + 7)^2 - (x-2)(x-3) = 1$
(iii) $\sqrt{x+5} - \sqrt{x+21} = \sqrt{6x+40}$
(iv) $x(x+2)(x^2-1) = -1$
(v) $3^{2x^2-7x+7} = 4$

30. (i) $x^4 + 5x^3 + 2x + 1$; $(x-1)^2$ න් බෙදූ විට ශේෂය සොයන්න.
(ii) $3x^5 + 7x^4 - 10x^3 + 2$; $(x+1)^2$ න් බෙදූ විට ශේෂය සොයන්න.
(iii) $x^4 - 10x^3 + 7x^2 + 8$; $(x-2)^2$ න් බෙදූ විට ශේෂය සොයන්න.
(iv) $x^4 + 6x^3 + ax + b$ ප්‍රකාශනය $(x-1)^2$ න් බෙදූ විට ශේෂය $5x + 7$ නම් $a$, b සොයන්න.

31. පහත ඒවා රේඛීය සාධකවලට වෙන් කරන්න.
(i) $x^2 + xy - 6y^2 + 4x + 7y + 3$
(ii) $x^2 + 2xy - 8y^2 + 4x - 2y + 3$
(iii) $3x^2 - 5xy - 2y^2 - 2x - 3y - 1$
(iv) $2x^2 - 9xy - 5y^2 + 22x + 20$
(v) $12x^2 + 7xy - 12y^2 + 50y - 48$

32. පහත ඒවා රේඛීය සාධක දෙකකට වෙන්කළ හැකි වන සේ k සොයන්න. (k - නියතයකි.)
(i) $x^2 - 3xy + 2y^2 + 2x - 5y + k$
(ii) $5x^2 + 13xy - 6y^2 - 7x + 13y + k$
(iii) $2x^2 + kxy + 3y^2 - 5y - 2$
(iv) $3x^2 + kxy + 2y^2 - 2x + y - 1$
(v) $2x^2 - xy - y^2 - kx + 6y - 5$

33. සාධක වෙන් කරන්න.

(i) $x(y^2-z^2)+y(z^2-x^2)+z(x^2-y^2)$

(ii) $a^2(b-c)+b^2(c-a)+c^2(a-b)$

(iii) $x(y-z)^3+y(z-x)^3+z(x-y)^3$

(iv) $a^3(b-c)+b^3(c-a)+c^3(a-b)$

(v) $x^4(y-z)+y^4(z-x)+z^4(x-y)$

(vi) $(a-b)^3+(b-c)^3+(c-a)^3$

(vii) $x^3+y^3+z^3-3xyz$

(viii) $(x+y+z)^3-x^3-y^3-z^3$

(ix) $(\alpha+\beta+\gamma)-\alpha^5-\beta^5-\gamma^5$

(x) $(a-b)^5+(b-c)^5+(c-a)^5$



## මිශ්‍ර ගැටළු

34. $x$ යනු $f(x)$ නම් බහුපද ශ්‍රිතයේ සාධකයක් වේ. $f(x)-f(x-1)=3x^2+5x$ ලෙස අර්ථ දක්වා ඇත්නම්, එම අර්ථ දැක්වීම භාවිතයෙන් $(x+1)$, $f(x)$ හි සාධකයක් බව පෙන්වන්න. තවද $f(x)$, $(x+2)$ න් බෙදූ විට ශේෂය $-8$ වේ. $(x-1)$ න් බෙදූ විට ශේෂය සොයන්න. එනයින් $f(x)$ නිර්ණය කරන්න.

35. $x^3+Ax^2+Bx+C$ ප්‍රකාශනයේ $(x^2+2)$ සාධකයක් වන අතර, $(x-2)$ න් බෙදූ විට ශේෂය 6 වේ. A, B, C සොයන්න.

36. $f(x)$ යනු 3 වෙනි මාත්‍රයේ බහු පදයකි. එය $(3x^2+1)$ න් බෙදූ විට ශේෂයක් ඉතිරි නොවේ. බහුපදය $(x-1)^2$ න් බෙදූ විට $16x-12$ ක ශේෂයක් ඉතිරි වේ. $f(x)$ සොයන්න.

37. $f(x)$ බහුපදය $(x^2-a^2)$ න් බෙදූ විට ශේෂය සොයන්න. එනයින් $f(x)=x^5+kx^2+2$ නම්, $f(x)$; $(x^2-1)$ න් බෙදූ විට ශේෂයේ නියත පද අඩංගු නොවේ නම්, k හි අගය සොයන්න.

38. (i) $f(x)=2x^3-x^2-2x+k$ වේ. මෙහි k යනු නිශ්ශූන්‍ය නියතයකි. $(x-k)$ යනු $f(x)$ හි සාධකයක් නම්, k හි අගය සොයන්න.

(ii) k හි එම අගය සඳහා $f(x)$ රේඛීය සාධක 2 ක ගුණිතයක් ලෙස ප්‍රකාශ කරන්න.

(iii) $f(x)\equiv(x-a)(2x+1)(x-1)+bx+c$ වන පරිදි $a$, b, c වල අගයන් සොයන්න.

39. $f(x)\equiv ax^4+bx^3+cx^2+dx+e$ ශ්‍රිතය $(x^2+2)$ න් බෙදූ විට ශේෂය, $(d-2b)x+(4a-2c+e)$ බව පෙන්වන්න.

40. $f(x)$ බහුපදය $(x-a)(x-b)(x-c)$ තෙන් බෙදූ විට ශේෂය, $A(x-b)(x-c)+B(x-c)+C$ ආකාරයට ලැබෙන බව ශේෂ ප්‍රමේයය නැවත නැවත යෙදීමෙන් පෙන්වන්න.

41. $3x^2-5xy+2y^2+\lambda x+3y-2$ ප්‍රකාශනය රේඛීය සාධක දෙකක ගුණිතයක් වීම සඳහා $\lambda$ ට තිබිය හැකි අගයන් සොයන්න. $\lambda$ හි එම අගයන් සඳහා රේඛීය සාධක ලියා දක්වන්න.

**42.** p, r ශූන්‍ය නොවන q තාත්ත්වික නියත විට, $f(x) = x^3 + px^2 + qx + r$ සහ
$g(x) = x^3 + rx^2 + qx + p$ යන ඝනජ බහු පද 2 කට පොදු වර්ගජ සාධකයක් තිබීමට අවශ්‍යතාවය,
$p = -r$ හා $p = -1$ විය යුතු බව පෙන්වන්න. එමගින්, $x^6 - 9x^4 - x^2 + 9 = 0$ හා
$9 + x^2 - 9x^4 - x^6 = 0$ සමීකරණ විසඳන්න.

**43.** $ax^3 + bx^2 + cx + d = 0$ හි මූලයක් $\alpha$ වේ. $ax^3 + 2bx^2 + 4cx + 8d = 0$ හි $2\alpha$ මූලයක් බව පෙන්වන්න. එනයින් $x^3 - 112x + 384 = 0$ හි මූල සොයන්න.

**44.** $ax^4 - 6x^3 + bx^2 - cx + 28$ බහුපදය $(x-2)^2$ න් හරියටම බෙදේ. $(x+8)$ න් බෙදූ විට ශේෂය 36 වේ. එම අගයන් ගන්නා විට බහුපදය $(x-1)$ න් බෙදූ විට ශේෂය සොයන්න.

**45.** $(5 + 2\sqrt{6})^{x^2-3} + (5 - 2\sqrt{6})^{x^2-3} = 10$ විසඳන්න.

**46.** $6x^4 - 25x^3 + 12x^2 + 25x + 6 = 0$ විසඳන්න.

**47.** $f(x) = x^4 - 10x^2 + p$ හි $(x^2 - 1)$ සාධකයක් නම්, p හි අගය සොයන්න. p හි එම අගයට අනුරූප $f(x)$ හි සාධක සියල්ල සොයන්න. එමගින් $2x^8 - 20x^4 + 18 = 0$ හි විසඳුම් සොයන්න.

**48.** $f(x)$ ශ්‍රිතයට පුනරාවර්තන සාධකයක් ඇත්නම්, එම සාධකය $f^1(x)$ වල සාධකයක් බව පෙන්වන්න. $x^3 - 5x^2 + 7$, $(x-1)^2$ න් බෙදූ විට ශේෂය සොයන්න.

**49.** $f(x, y) = 6x^2 + axy + 6y^2 - 10y - 24$ බහුපදය රේඛීය සාධක 2 කට වෙන් කරවීම සඳහා $a$ සොයන්න.

**50.** $a^3(b - c) + b^3(c - a) + c^3(a - b)$ සාධක වෙන් කරන්න.

**51.** $a^2(b - c) + b^2(c - a) + c^2(a - b)$ හි සාධක සොයන්න.

**52.** $[x - (P + Q)]$ යනු $x^3 - 3PQx - (P^3 + Q^3)$ හි සාධකයක් බව පෙන්වන්න.
එනයින් $x^3 - 6x - 6 = 0$ හි තාත්ත්වික මූලයන් සොයන්න.

**53.** බහුපද ප්‍රකාශන පිළිබඳ සාධක ප්‍රමේයය ප්‍රකාශ කරන්න.
$f(x) = 2x^3 - x^2 - 5x + 3$ වේ. මෙම බහුපදය $(x+1)$ න් බෙදූ විට ශේෂය 5 ක් වේ.
එනයින් $f(x) - 5$ හි සාධකයක් අපෝහනය කරන්න. $f(x) - 5$ බහුපදය ඒකජ සාධකවල ගුණිතයක් ලෙස ලියන්න.

**54.** $2x^3 + 3x^2 + ax - 60$ බහුපදයේ $(x+2)$ සාධකයකි. $a$ හි අගය සොයා, බහුපදය ඒකජ සාධක 3 ක ගුණිතයක් ලෙස ලියා දක්වන්න. බහුපදය ධන නොවන්නා වූ $x$ හි පරාසය ලියන්න.

**55.** $f(x)$ වර්ගජ ශ්‍රිතය $(x-2)$, $(x-1)$, $(2x+1)$ මගින් බෙදූ විට ශේෂ පිළිවෙලින් $-5, -6, 0$ වේ. $g(x)$ යනු හතරවන මාත්‍රයේ ශ්‍රිතයක් විට $f(x)$ යනු $g(x)$ වල සාධකයක් වේ. $g(x)$ ට පුනරාවර්තන සාධක ඇත. $(x-2)^2$ මගින් $g(x)$ බෙදූ විට ශේෂය $-3(x+13)$ නම්, $g(x)$ සොයන්න.

**56.** $f(x)$ යනු $x^3 + 3x^3 - 2x^3 + 2x^2 - 3x + 1$ බහුපද ශ්‍රිතයක් වන විට,

(i) $(x-1)$ හෝ $(x+1)$ ; $f(x)$ වල සාධකයක් නොවන බව පෙන්වන්න.

(ii) $f(x)$ යන්න $(x^2-1)$ වලින් බෙදූ විට ශේෂය සොයන්න.

(iii) $f(x)$ යනු $x^2+1$ වලින් බෙදූ විට ශේෂය 2 වන බව පෙන්වා, මෙයින් $f(x) - 2$ වල ඒකජ සාධකයක් සොයන්න.

**57.** $x + \frac{1}{x} = t$ ආදේශය භාවිතයෙන්, $x^4 - 5x^3 + 8x^2 - 5x + 1 = 0$ හි මූල සොයන්න.

**58.** (i) $x^2 + 2$ යනු $x^4 - 6x^2 + p$ හි සාධකයකි. p නියතය සොයන්න. එනයින් $x^4 - 6x^2 + p$ හි සාධක සොයන්න.

(ii) $x^3 - ax^2 + b$ සහ $x^4 - ax^3 + bx^2 + 4$ යන බහු පද දෙකටම පොදු සාධකයක් $(x+1)$ වේ. $a$ සහ b නියත සොයන්න.

**59.** $ax^3 + bx^2 + cx + d$, $x^2 + k^2$න් ඉතිරි නැතිව බෙදෙයි නම්, $\frac{a}{b} = \frac{c}{d}$ බව පෙන්වන්න.

**60.** $P(x)$ යනු සහජ බහුපදයක් ද, $x^2 + x + 1$ මගින් $P(x)$ බෙදූ විට ශේෂය $(2x+3)$ ද, $x(x+3)$ මගින් $P(x)$ බෙදූ විට ශේෂය $5(x+1)$ ද වේ. $P(x)$ සොයන්න.

**61.** q ඔත්තේ නම්, $(x^p + 1)$ යනු $(x^{pq} + 1)$ හි සාධකයක් බව පෙන්වන්න. එනයින් හෝ අන් ක්‍රමයකින් හෝ $x^{21} + 1$ හි සාධක තුනක් $(x+1)$, $(x^2 - x + 1)$, $(x^6 - x^5 + x^4 - x^3 + x^2 - x + 1)$ බව පෙන්වන්න.

**62.** $(x^3 + px + \gamma)$ සහ $(3x^2 + p)$ යන බහු පද දෙකටම පොදු ඒකජ සාධකයක් ඇත්නම් $\frac{p^3}{27} + \frac{r^2}{4} = 0$ බව පෙන්වන්න.

**63.** (i) $4x^4 - 12x^3 + 25x^2 - 24x + 16$ බහුපදය දෙවෙනි මාත්‍රයේ බහුපදයක පරිපූර්ණ වර්ගයක් බව පෙන්වන්න.

(ii) $x^4 - ax^3 - bx^2 - x + 1$ යන දෙවැනි මාත්‍රයේ බහු පදයක පරිපූර්ණ වර්ගයක් නම්, $a = c$ හා $b = \frac{a^2}{4} + 2$ බව පෙන්වන්න.

**64.** (i) $x - p$ යන්න $4x^3 - (3p+2)x^2 - (p^2-1)x + 3$ හි සාධකයක් වන p හි අගය සොයන්න. p ට අදාලව ප්‍රකාශනයේ ඉතිරි සාධක ද සොයන්න.

(ii) $a^3 + b^3 + c^3 + kabc$ යන්න $a + b + c$ වලින් බෙදේ නම්, k හි අගය සොයන්න.

(iii) $f(x) \equiv ax^3 + bx + c$ යන්න $x-2, x+1, x+3$ න් බෙදූ විට ශේෂය 1, 2 හා $-4$ වේ. $a$, b, c හි අගයන් සොයා $f(x) = 0$ විසඳන්න.

(iv) $(x-k)^2$ යන්න $x^3 + 3px + q$ හි සාධකයක් නම්, $4p^3 + q^2 = 0$ බව පෙන්වන්න.

**65.** $(x + b + c)$ යනු $x^3(b-c) - x(b^3 - c^3) + b^3c - bc^3$ හි සාධකයක් බව පෙන්වන්න. එහි ඉතිරි සාධක සොයන්න.

**66.** $f(x)$ යනු $x$ හි 4 වන මාත්‍රයේ බහු පදයකි. $f(0) = 12$ වේ. $(x-2)$ යනු $f(x)$ හි දෙවරක් පුනරාවර්තන සාධකයක් වේ. $f(x)$ යන්න $(x^2 + 1)$ න් බෙදූ විට ශේෂය $6 - 8x$ වේ. $f(x)$ සොයන්න.

**67.** $g(x)$ 4 වෙනි මාත්‍රයේ බහුපද ප්‍රකාශනයක් වේ. එය $(x^2 + 1)$ න් හරියටම බෙදේ. $g(x)$, $(x-1)^2$ $(x+1)$ න් බෙදූ විට ශේෂය $-10x + 6$ නම්, $f(x)$ සොයන්න.

**68.** $f(x) = x^4 + ax^3 + bx + c$ වේ. $f(x)$ යන්න $(x-1)(x+1)(x-2)$ න් හරියටම බෙදේ නම්, $a$, b, c නියත සොයා, ඉතිරි සාධකය ද සොයාගන්න. $2f(x+1) = x^2 + x - 2$ සමීකරණයද විසඳන්න.

**69.** $2x^3 + 3x^2 + cx - 60$ බහුපදයේ $(x+2)$ සාධකයකි. c හි අගය සොයා, බහුපදය ඒකජ සාධක තුනක ගුණිතයක් ලෙස ලියා දක්වන්න. බහු පදය ධන නොවන්නා වූ $x$ හි පරාසය ලියන්න.

**70.** $x^4 + x^2 + x + 1 \equiv (x^2 + A)(x^2 - 1) + Bx + C$ සර්ව සාම්‍යය තෘප්ත කරන්නා වූ A, B, C අගයන් සොයන්න. එය භාවිතයෙන් 100010101 යන්න 9999 න් බෙදූ විට ලැබෙන ශේෂය සොයන්න.

**71.** $f(x)$ බහුපදය $(x-1)$ න් බෙදූ විට ශේෂය 2 වන අතර, $(x-2)$ න් බෙදූ විට ශේෂය 3 වේ. $f(x)$ යන්න $(x-1)(x-2)$ න් බෙදූ විට ශේෂය සොයන්න.

**72.** $f(x)$ බහුපදය 3 වන මාත්‍රයේ බහු පදයක් වන අතර, $x^3$ හි සංගුණකය බව දී ඇත. $-1$ යනු $f(x) = 0$ සමීකරණයේ මූලයක් නම්, $f(x)$ බහුපදය සොයා, $f(x) = 0$ සමීකරණයට වෙනත් තාත්ත්වික මූල නොමැති බව පෙන්වන්න. $x^2 - x + 2$ න් බදූ විට $(5x - 7)$ ක ශේෂයක් ද, $x^2 + x - 1$ න් බෙදූ විට $(12x - 1)$ ක ශේෂයක් ද ලැබෙන පරිදි වූ $x$ හි තුන්වන මාත්‍රයේ බහුපදය සොයන්න.

**73.** (i) ශේෂ ප්‍රමේයය ප්‍රකාශ කර සාධනය කරන්න.

$f(x) = a_n x^n + a_{n1} x^{n-1} + \dots\dots\dots + a_1 x + a_0$ යන බහුපද ශ්‍රිතය $x^n - h^2$ න් බෙදූ විට ශේෂය $\frac{1}{2}[f(h) - f(h)]\,x + \frac{1}{2}[f(h) - f(h)]$ බව පෙන්වන්න.